# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2026/6 - 2017 ජූලි මස 03 වැනි සඳුදා - 2017.07.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ යොමු අංකය* : KOLDS/LND/05/ACQ/11.
*ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය* : J/76/E/564.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත සඳහන් පළමුවැනි උපලේඛනයේ හා දෙවැනි උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම් ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*පොදුජන කටයුත්ත* : ර/බුළුතොට කණිෂ්ඨ විද්‍යාලය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම් වල විස්තර:*

### පළමුවැනි උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොලොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොලොන්න කෝරළේ, සුළු කොට්ඨාසයේ අංක 202, බුළුතොට ග්‍රාම නිලධාරී වසමේ උඩවෙල ගමේ පිහිටි රත්නපුර සර්වේයර් ජනරාල් විසින් 2016.12.30 දිනැතිව මැන සකස් කරන ලද අවසාන ගම් පිඹුරු අංක 928 අතිරේක අංක 1, පත්‍ර අංක 1 දරන පිඹුරේ කැබලි අංක 189 වශයෙන් දැක්වෙන ''කටුකිතුල්ගලහේන'' නමැති ඉඩමෙන් හෙක්ටයාර් 0.4357 ක් පමණ වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස (01).

**01. කැබලි අංක 189 – ඉඩමේ නම: කටුකිතුල්ගලහේන; හිමිකම් කියන්නන්ගේ නම්: තිබ්බොටුව විතානගේ සුගතදාස, මානවෙල විතාරමගේ ජේන්නෝනා, කොඩිතුවක්කු ආරච්චිලාගේ මොහොට්ටි අප්පුහාමි; ප්‍රමාණය: හෙක්ටයාර් 0.4357.**

උතුරට: කැබලි අංක 141, 188 සහ 187; නැගෙනහිරට: කැබලි අංක 188, 187 සහ 923; දකුණට: අ.ග.පි. 923 (බුළුතොට); බටහිරට: කැබලි අංක 141, 188 සහ 187.

### දෙවැනි උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොලොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොලොන්න කෝරළේ, සුළු කොට්ඨාසයේ, අංක 202, බුළුතොට ග්‍රාම නිලධාරී වසමේ බුළුතොට ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් 2017.01.17 දිනැතිව මැන සකස් කරන ලද අවසාන ගම් පිඹුරු අංක 923, පත්‍ර අංක 0 10/5 දරන පිඹුරේ කැබලි අංක 243 සහ 244 වශයෙන් දැක්වෙන ''ඇල්දෙනියේහේන/කටුකිතුල්ගලේහේන'' නමැති ඉඩමෙන් හෙක්ටයාර් 0.0624 ක් පමණ වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස් (02).

**01. කැබලි අංක 243 – ඉඩමේ නම: ඇල්දෙනියෙහේන; හිමිකම් කියන්නන්ගේ නම: සමරසිංහගේ සයිමන්; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0215.**

උතුරට: අ.ග.පි. 928 (උඩවෙල) සහ කැබලි අංක 244; නැගෙනහිරට: කැබලි අංක 244, 246 සහ 245; දකුණට: කැබලි අංක 245; බටහිරට: අ.ග.පි. 928 (උඩවෙල).

**02. කැබලි අංක244 – ඉඩමේ නම: ඇල්දෙනියේහේන/ කටුකිතුල්ගලේහේන; හිමිකම් කියන්නන්ගේ නම: කරනම්මුණිගේ බබුන්කිරා; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0409.**

උතුරට: අ.ග.පි. 928 (උඩවෙල); නැගෙනහිරට: කැබලි අංක 246; දකුණට: කැබලි අංක 246, 245 සහ 243; බටහිරට: කැබලි අංක 243.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2017 අගෝස්තු මස 10 වැනි දින පෙ. ව. 9.30 ට කොලොන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2017 ජූලි මස 28 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. අයිතිවාසිකම් සනාථ කිරීම සඳහා අදාළ ලිපිලේඛන පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

එස්. එම්. ඩී. සී. සමරසේකර,
ප්‍රාදේශීය ලේකම්/
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී,
කොලොන්න.

2017 ජුනි මස 22 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය,
කොලොන්න.

07 - 499

---

ශුද්ධි පත්‍රිකාවයි

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : 7/3/1/13/විසල්/මා/අත්.
*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශ යොමු අංකය* : 4/3/9/2013/WS/473.

ඉඩම් අත්පත් කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය) 7 වන වගන්තිය යටතේ මා විසින් පල කළ අංක 2019/3 හා 2017 මැයි මස 15 ගැසට් පත්‍රයේ සඳහන් හිමිකම් පරීක්ෂණය හා වන්දි පරීක්ෂණය වෙනුවට 2017 අගෝස්තු 16 වන දින පෙ. ව. 10.00 ලෙස සංශෝධනය කරන බව මෙයින් දැනුම් දෙමි.

ඩබ්ලිව්. එම්. ආනන්ද,
ප්‍රාදේශීය ලේකම්,
පල්ලේපොල.

2017 ජුනි මස 28 වැනි දින,
පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

07 - 500

---

ශුද්ධි පත්‍රිකාවයි

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : MCUDP/LA/ABT/(W-05)/14/03.
*ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය* : 4-3/10/2014/LRB/292.

උක්ත යොමු අංක යටතේ ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ දැන්වීම, දැන්වීම් අංක 2016/17 සහ 2017 අප්‍රේල් මස 25 දින *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රසිද්ධ කර ඇත.

එකී දැන්වීමෙහි එම ඉඩම් සඳහා අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 මැයි මස 31 වැනි දින පෙ.ව. 9.30 ට රාජගිරිය, වැලිකඩ, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 03 දරණ ස්ථානයේ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ පිහිටා ඇති කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ ඉඩම් අත්කර ගැනීමේ කාර්යාලයේ දී මා හමුවන ලෙස දන්වා ඇත. එහෙත් එම දිනය හා වේලාව 2017 ජූලි මස 13 වැනි දින පෙ. ව. 10.30 ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් දන්වා සිටිමි.

සී. ඩබ්. අබේසූරිය,
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී,
කොළඹ අගනගර ආශ්‍රිත නාගරික
සංවර්ධන ව්‍යාපෘතිය.

2017 ජූලි මස 03 වැනි දින,
කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය,
අංක 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.

07 - 501

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.